සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 09 - 2023

## පෙරදිග සංගීතය I

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.

1. භූපාලි රාගයේ වර්ජිත ස්වර දෙක වන්නේ
   1 ග හා ධ වේ 2 ම හා නි වේ 3 ධ හා ග වේ 4 ම හා ස වේ

2. ශුද්ධ ස්වර 7 ම යෙදී ඇති නිර්දේශිත රාගය වන්නේ,
   1 කාෆි රාගයයි 2 යමන් රාගයයි 3 බිලාවල් රාගයයි 4 භූපාලි රාගයයි

3. හින්දුස්ථානී සංගීත පද්ධතියේ රාග නිර්මාණය සඳහා භාවිතා වන ථාට ගණන වන්නේ
   1 06කි 2 10කි 3 12කි 4 72කි

4. රාගයක විස්තර ඇතුළත් ගීත විශේෂය වන්නේ
   1 සර්ගම් ගීත ය 2 මධ්‍යලය ගීත ය 3 ලක්ෂණ ගීත ය 4 ස්වර ස්ථාපන ගීත ය

5. බටහිර සංගීතයේ ¾ යන "Time Signature" ට ගැලපෙන හින්දුස්ථානී තාලය වන්නේ
   1 බෙම්ටෝ තාලයයි 2 ජප් තාලයයි 3 දීප්චන්දි තාලයයි 4 ධාදරා තාලයයි

6. රාගයක ආරෝහණ අවරෝහණ තුල වාදි සංවාදි ස්වර හැරුණ විට රාගයක ඉතිරි ස්වර හැඳින්වෙන්නේ,
   1 වර්ජිත ස්වර නමිනි 2 අනුවාදී ස්වර නමිනි 3 විවාදි ස්වර නමිනි 4 අචල ස්වර නමිනි

7. ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ වල කළු යතුරක් නොපිහිටන ස්වර 02 වන්නේ,
   1 රි ග අතරය 2 ම ප අතරය 3 ග ම අතරය 4 ධ නි අතරය

8. "එකෝඩියන්" නම් සුෂිර වාද්‍ය භාණ්ඩයේ ඇති සුවිශේෂීතාවය වන්නේ
   1 ගී තනුව වාදනය කළ හැකි වීමයි 2 කෝඩ්ස් වාදනය කළ හැකිවීමයි
   3 රිදම් වාදනය කළ හැකි වීමයි 4 තනුව සහ කෝඩ්ස් යන දෙකම එකවර වාදනය කළ හැකි වීමයි

9. මාත්‍රා 4න් 4 යෙදෙන හින්දුස්ථානී තාලපද යුගලය වන්නේ,
   1 ත්‍රිතාල් හා දීප්චන්දි 2 කෙහෙර්වා හා ත්‍රිතාල්
   3 කෙහෙර්වා හා දිප්චන්දි 4 ත්‍රිතාල් හා ධාදරා

10. ගිටාරයෙන් උපදවාගත හැකි පහළම ස්වරය වන්නේ
    1 මන්ද්‍ර සඩ්ජයයි 2 මන්ද්‍ර ගාන්ධාරයයි 3 මන්ද්‍ර පංචමයයි 4 මන්ද්‍ර ධෛවතයයි

11. සාමාන්‍ය බොක්ස් ගිටාරයක තත් සුසර කරන අනුපිළිවෙල නිවැරදිව සඳහන් වී ඇති පිළිතුර වන්නේ
    1 EADGBE 2 ABCDEF 3 EFGABC 4 GDEFGA

12. සිංහල කණ්ඩායම් සංගීතයේ නිර්මාතෘ ලෙස සැලකෙන්නේ

1 ක්ලැරන්ස් විජේවර්ධන
2 නෙවිල් ප්‍රනාන්දු
3 සී. ටී. ප්‍රනාන්දු
4 ෂෙල්ටන් ප්‍රේමරත්න

13. ශ්‍රී ලංකාවේ මුල්ම ගායක කණ්ඩායම් දෙක වන්නේ,

1 සමනළයෝ සහ මූන්ස්ටෝන්
2 ත්‍රී සිස්ටර්ස් සහ ලාසිලනියන්ස්
3 ලොස් කැබලෙරොස් සහ ලාසිලනියන්ස්
4 ලාබම්බාස් සහ මූන්ස්ටෝන්

14. "I Have a Dream" යන ප්‍රසිද්ධ ගීතය ගයන ලද්දේ

1 ABBA සංගීත කණ්ඩායම
2 Boney M සංගීත කණ්ඩායම
3 ධර්මරත්න බ්‍රදර්ස් කණ්ඩායම
4 Labambas සංගීත කණ්ඩායම

15. C Major කෝඩ් එකට අයත් ස්වර වන්නේ,

1 පනිරි
2 සගප
3 මධස්
4 සගුප

16. "හෙළ ගැඹුරුයි පුත නොබලන්" යන ගීතය අයත් නව නාට්‍යය වන්නේ,

1 නරිබෑණා
2 රාජකපුරු
3 හුණුවටයේ කතාව
4 තාරාවෝ ඉගිලෙති

17. F Major ස්කේලයට අදාල ස්වර ඇතුලත් පිළිතුර වන්නේ,

1 මපධුනිසරිගම්
2 මපධනුිසරිගම්
3 මපධනිසරිගුම්
4 මපධුනිසරුිගම්

18. ප්‍රධාන තත් 07ක් සහ අනුනාදතත් වලින් සමන්විත සංගීත භාණ්ඩයක් වන්නේ,

1 වයලීනය
2 එස්රාජ්
3 සිතාරය
4 ගිටාරය

19 "දුනුකෙයියා මලක් වගේ දුරට පෙනෙනවා" යන ගීතය ගායනා කරන ලද ගායිකාව

1 නන්දා මාලිනීය
2 සුජාතා අත්තනායක ය
3 චන්ද්‍රලේඛා පෙරේරා ය
4 මාලිනී බුලත්සිංහල ය

20 මිශ්‍ර මත් කැටි රිද්ම රටාවකි

1 /x x /x - / x x / x - /
2 /xxx /x - - / xxx / x - - /
3 /x-xx /xxx- /x-xx /xxx-/
4 /xx- /xxxx /x - x /xxxx/

(ලකුණු 1 x 20 = ලකුණු 20)

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.

01. නිර්දේශිත හින්දුස්ථානී රාග 02ක තොරතුරු පහත දැක්වේ. ඒ ඇසුරින් පිළිතුරු සපයන්න.
 * ඖඩව ජාති රාගයකි
 * දිවා ප්‍රථම ප්‍රහාරයේ ගැයේ
 * ග හා ධ වාදී සංවාදී වේ
 * සරිපමනි අනුවාදී ස්වර ලෙස යෙදේ
 * ම හා නි ස්වර වර්ජිත වේ
 * ශුද්ධ ස්වර 07ම යොදාගනී
 i ඉහත තොරතුරු වලට අදාළ රාග දෙක නම් කරන්න. ල 02
 ii එම තොරතුරු රාග දෙකට අදාලව වෙන් කර ලියන්න ල 03
 iii ඔබ කැමති රාගයක මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්ථාර කරන්න ල 03
 iv ඉහත ඔබ තෝරා නොගත් රාගයේ ආරෝහණ අවරෝහණ ස්වර ලියන්න. ල 02

02. i ස්වර පුවරුවක රූප සටහනක් ඇද මධ්‍ය සප්තකයට අයත් ස්වර දොළස ලකුණු කරන්න ල 04
 ii ස්වර සප්තකයක ඇති චල ස්වර සහ අචල ස්වර ලකුණු කර පෙන්වන්න ල 02
 iii G major ස්කේල් (Scale) එකට අදාල ස්වර ලියන්න ල 04

03. පහත සඳහන් වන්නේ නව නාට්‍ය සහ කණ්ඩායම් ගී වලට අයත් ගීත කිහිපයකි
 * ඇත කඳුකර හිමව් අරණේ
 * මුළු ගතම වෙහෙසුනා
 * හනික වරෙව් කොල්ලනේ
 * පාවෙන පීරිසියක් උඩ නැගලා
 * කුමටද සොබනියෙ කඳුළු සලන්නේ
 * මංගෝ කළු නැන්දේ ...
 i ඉහත ගීත පාද නව නාට්‍ය හා කණ්ඩායම ගීත අනුව වෙන් කර ලියන්න. ල 03
 ii කණ්ඩායම් සංගීතයේ සුවිශේෂී ලක්ෂණ 03ක් ලියන්න ල 03
 iii නරිබෑනා සහ බෙරහඬ යන නවනාට්‍ය නිශ්පාදක වරුන් පිළිවෙලින් නම් කරන්න. ල 04

04. පහත සඳහන් වන්නේ අපරදිග භාණ්ඩ කිහිපයකි
 * වයලීනය, ට්‍රම්පට්, සැක්සපෝන්, බේස්ඩ්‍රම්, ගිටාරය, සිම්බල්, මැන්ඩලීනය, සයිඩ්ඩ්‍රම්, ෆ්ලූට්
 i පහත සඳහන් වර්ගවලට අනුව වෙන්කර ලියන්න
 String
 Wind
 Percussion ල 04
 ii ඒ අතරින් අළුවෙන් (Bow) වයන සහ නියඟින් (Pick) වයන භාණ්ඩ දෙකක් නම් කරන්න ල 02
 iii ගිටාරයක දළ රූප සටහනක් ඇඳ ශුද්ධ ස්වර හත ලකුණු කරන්න. ල 04

05. පහත දැක්වෙන මාතෘකා අතරින් 5ක් පිළිබඳව කෙටියෙන් පැහැදිළි කරන්න
 1 වාදි ස්වර 2 ආවර්ත 3 වයලින් පවුල 4 ලය 5 මේල 6 ජාති 7 Flat note ල 2x5 = 10

පළමු පත්‍රයට ලකුණු 20
දෙවන පත්‍රයට ලකුණු 30
50

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 09 - 2023

# පෙරදිග සංගීතය - (ප්‍රායෝගික පරීක්ෂණ)

01. නිර්දේශිත රාගයක

| | |
|---|---|
| ආරෝහණ ගායනය/වාදනය | ල 02 |
| අවරෝහණ ගායනය/වාදනය | ල 02 |
| ස්ථායි ගායනය/වාදනය | ල 03 |
| අන්තරා ගායනය/වාදනය | ල 03 |
| | ල 10 |

02. නිර්දේශිත රාගයක සර්ගම් ගීතයක

| | |
|---|---|
| ස්ථායි ගායනය/වාදනය | ල 05 |
| අන්තරා ගායනය/වාදනය | ල 05 |
| | ල 10 |

03. නූර්ති/නවනාට්‍ය හා කණ්ඩායම් ගීත අතරින් කැමති ගීතයක් ගායනය/වාදනය — ල 10

04. ගොයම් ගී/දරු නැළවිලි ගී/කෙළි ගී/ නෙළුම් ගී අතරින් කැමති ගීතයක් ගායනය — ල 10

05. ස්වර පුවරු භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය — ල 05
තෝරාගත් භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය — ල 05

මුළු ලකුණු 5 x 10 50